විවිධ ප්‍රසංග වලදී දක්නට ලැබෙන නර්තන

විවිධ ප්‍රසංග වලදී දක්නට ලැබෙන නර්තන

විවිධ ප්‍රසංග වලදී විවිධ නර්තන ගායන, වාදන දක්නට ලැබේ. මේවා ඒකල හා සමූහ වශයෙන් ඉදිරිපත් කළ හැක. සම්ප්‍රදායික ශාස්ත්‍රීය මෙන්ම නිර්මාණාත්මක නර්තන හා ගැමි නැටුම් ද මෙහිදී විශේෂත්වයක් ගනී.

මෙහිදී රංග වස්ත්‍රාභරණ විවිධත්වයෙන් යුක්ත වෙයි. එමෙන්ම වේදිකා සැරසිලි ද නර්තනයන්ට උචිත පරිදි යොදා ගැනේ. එමෙන්ම අවකාශ භාවිතය මනාව අවබෝධ කොට ගෙන නිසි පරිදි වේදිකාට පරිහරණය කළ යුතුවේ.

විවිධ ප්‍රසංගයකදී නර්තන ඉදිරිපත් කරන විට සාමූහික සහභාගීත්වය අවශ්‍යය. උසස් ගුණාංග පුහුණු කිරීමට විවිධ ප්‍රසංගයේදී ඉදිරිපත් කරන නර්තන කලා කෘති උපකාරී වේ.

විවිධ ප්‍රසංගයක තිබිය යුතු අංග

(උදාහරණයකි)

1. සරස්වතී පූජාව

2. පිළිගැනීමේ ගීතය

3. ගැමි නැටුම

4. වන්නම

5. කෙටි නාට්‍ය

6. භරත නැටුමක්